හොරණ ප්‍රාදේශීය සභාව
කළුතර දිස්ත්‍රික්කය
--------------------------------

1. **<u>මූල්‍ය ප්‍රකාශන</u>**

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින හා සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2018 සැප්තැම්බර් 18 දින ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 15 දින සභාපතිවරයාට යවා ඇත.

1:2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර , මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට හොරණ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **<u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>**

1.3.1 **<u>ගිණුම්කරණ අඩුපාඩු</u>**

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේදී රු.11,698,675 ක ශේෂයක් සමුච්චිත අරමුදලට බැර කර තිබූ නමුත් ඊට අදාල හර සටහන් දක්වා නොතිබුණි.

(ආ) 2016 වර්ෂයේ විගණකාධිපති වාර්තාවෙන් පෙන්වා දුන් 2.2.1 (ඇ) ගිණුම්කරණ අඩුපාඩුව නිවැරදි කර නොතිබුණි.

1.3.2 **<u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>**

2002 වර්ෂයේ සිට 2012 දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු.2,398,988 ක එකතු කළ අගය මත බදු මුදල සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ගෙවා නොතිබුණි.

1:3:3 **<u>විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම</u>**

අදාළ උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.34,793,939 ක් වූ ගිණුම් විෂයයන් 06 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යක්ෂණය / සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1:3:4 <u>නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්</u>

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | |
| (i) 134 (1) වගන්තිය | --- | අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව සභාව විසින් වරිපනම් බදු සඳහා නව හඳුනාගැනීමක් සිදු කර නොතිබුණි. |
| (ii) 154(1) වගන්තිය | --- | සභා බල ප්‍රදේශයේ ඉඩම් වෙන්දේසි කිරීමේදී වෙන්දේසි කරනු ලබන ඉඩම්වල විකුණුම් මිලෙන් සියයට 1 ක ආදායමක් ලබාගෙන නොතිබුණි. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 | 63,674,172 | සභාව සතු සියලු ඉඩම් ගොඩනැගිලි සෑම වර්ෂයකටම වරක් හෝ පරීක්ෂා කිරීමකට ලක් කර නොතිබුණි. |
| (ඇ) 2011 පෙබරවාරි 24 දිනැති විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2/2011 දරන චක්‍රලේඛයේ 4.1 වගන්තිය | 635,045 | අනියම් හා තාවකාලික සේවකයින්ගේ දායක මුදල් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට යැවිය යුතු වුවත් සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්ති භාර අරමුදල වෙත ප්‍රමාද වී ප්‍රේෂණය කිරීම හේතුවෙන් දඩ මුදල් ලෙස ගෙවා තිබූ රු.635,045 ක මුදල ඊට වගකිවයුතු නිලධාරින්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2:1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,900,792 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.10,485,433 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2:2:1 ඇස්තමේන්තුගත ආදායම් , බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 ඇස්තමේන්තුගත ආදායම | 2017 බිල් කළ ආදායම | 2017 රැස් කළ ආදායම | 2017 දෙසැම්බර්31 දිනට මුළු හිඟය | 2016 ඇස්තමේන්තුගත ආදායම | 2016 බිල් කළ ආදායම | 2016 රැස් කළ ආදායම | 2016 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) වරිපනම් හා බදු | 15,528,874 | 13,102,390 | 13,939,952 | 3,745,463 | 15,432,100 | 14,496,868 | 12,077,553 | 4,583,025 |
| (ii) කුලී | 3,682,000 | 2,008,955 | 1,744,816 | 264,139 | 3,477,000 | 1,994,251 | 1,901,081 | 93,720 |
| (iii) බලපත්‍ර ගාස්තු | 1,096,625 | 907,339 | 871,338 | - | 1,047,000 | 916,192 | 916,192 | - |
| (iv)වෙනත් ආදායම් | 106,990,400 | - | 58,474,463 | - | 75,721,900 | - | 57,626,130 | - |

2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යය සාධනය

සමාලෝචිත වර්ෂය ආරම්භයට සභාවේ සමස්ථ හිඟ ආදායම රු.4,676,745 ක් වූ අතර වර්ෂය තුළ බිල් කිරීම රු.16,018,685ක් විය. වර්ෂය තුළ ලැබීම් , කපාහැරීම් හා ගැලපීම් රු.16,685,828 ක් වීම නිසා සමස්ථ ආදායම් හිඟය රු.4,009,602 ක් විය.

2.2.3 වරිපනම් හා බදු

(අ) වරිපනම් බදු

(i) සමාලෝචිත වර්ෂය ආරම්භයට රු.4,507,492 ක හිඟයක් පැවති අතර වර්ෂය තුළදී හිඟයෙන් රු.2,733,734 ක් හෙවත් සියයට 61 ක් අයකරගෙන තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයට වරිපනම් බිල් කළ ආදායම රු.9,071,879 ක් වූ අතර වර්ෂය තුළදී ඉන් රු.7,434,814 ක් හෙවත් සියයට 82 ක් අයකරගෙන තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය අවසානයට රු.3,410,822 ක් වූ හිඟ වරිපනම් ආදායම තුළ වසර 01 සිට 03 දක්වා ඒකක 1055 කින් රු.1,163,437 ක්, වසර 03 සිට 05 දක්වා ඒකක 212 කින් රු.271,277 ක්, වසර 5 සිට 10 දක්වා ඒකක 573 කින් රු.704,403 ක් හා වසර 10 ට වැඩි ඒකක 348 කින් රු.441,356 ක් විය.

(ආ) අක්කර බදු

සමාලෝචිත වර්ෂය ආරම්භයට රු.75,533 ක හිඟයක් පැවති අතර වර්ෂය තුළදී හිඟයෙන් රු.45,040 ක් හෙවත් සියයට 60 ක් අයකරගෙන තිබීම නිසා තවදුරටත් රු.30,493 ක ශේෂයක් අයකර ගැනීමට තිබුණි.

2.2.4 වෙනත් ආදායම්

රථවාහන නවතා තැබීමේ ගාස්තු

ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ ත්‍රිරෝද රථ නැවතුම්පල වලින් ගාස්තු අය කිරිම සඳහා ත්‍රිරෝද රථ නවතා තැබීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාව සභාව විසින් වැළඳ ගෙන තිබුණද ත්‍රිරෝද රථ නවතා තබන ස්ථාන හඳුනාගෙන ගාස්තු අය කිරිමට කටයුතු කර නොතිබුණි.

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා ගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.9,261,328 ක් හා මුද්දර ගාස්තු රු.59,270,556 ක් විය.

3. **<u>මෙහෙයුම් සමාලෝචනය</u>**

3:1 <u>කාර්ය සාධනය</u>

ප්‍රාදේශිය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය , පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරිම , ජනතාවගේ සුබ විහරණය , පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තවයන් ඉටු කිරිම පිළිබඳව අනාවරණය වු කරුණු පහත දැක්වේ.

(අ) <u>අතුරු ව්‍යවස්ථා</u>

ප්‍රාදේශිය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 16 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබු නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 04 ක් වෙනුවෙන් සභාව විසින් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

(ආ) **<u>ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය</u>**

2017 වර්ෂය සඳහා කසළ කළමනාකරණය වෙනුවෙන් සභාව විසින් රු.30,510,949 ක වියදමක් දරා තිබූ අතර එකී වියදම් පියවා ගැනීමට හෝ අවම කර ගැනීම පිණිස අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. කසළ කළමනාකරණය සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථාවක් පනවා නොතිබූ අතර කසළ පිරිවැය අවම කර ගැනීම සඳහා කසළ බදු පැනවීමක්ද සිදු කර නොතිබුණි.

(ඇ) <u>තිරසර සංවර්ධන ඉලක්ක</u>

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා නව ගෝලීය දර්ශක තුලින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගු කාලීන සැලසුම් 2018 අප්‍රේල් 23 දින වන විටත් සකස් කර නොතිබුණි.

3:2 <u>මානව සම්පත් කළමනාකරණය</u>

(අ) <u>සේවක පුරප්පාඩු හා අතිරික්ත</u>

i. ද්විතීයික මට්ටමේ නිලධාරීන් 6 දෙනෙකුගේ පුරප්පාඩු පැවති අතර එක් අයකුගේ අතිරික්තයක් පැවතුණි.

ii. අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු 06 ක පුරප්පාඩු නොතිබියදී අනුමත කාර්යය මණ්ඩලය වැඩි කරවා ගැනිමකින් තොරව ස්ථිර සේවකයින් ලෙස නිලධාරින් 43 දෙනෙකු බඳවාගෙන තිබුණි.

(ආ) <u>සේවක ණය</u>

සේවය හැර ගොස් ඇති සේවකයින් 06 දෙනෙකුගෙන් 2014 වර්ෂයේ සිට රු.18,700 ක ණය ශේෂයක් අයවීමට පැවතුණි.

3.3 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

කනන්විල උපකාර්යාලය හා පොකුණුවිට උප කාර්යාල වල ඉදිකිරීම් අවසන් වු ගොඩනැගිලි අයදුම්පත් 285 ක් පැවතියද ඉන් 28 දෙනෙකු පමණක් අනුකූලතා සහතික ලබාගෙන තිබු අතර ඉතිරි අය සඳහා අනුකූලතා සහතික ලබාදීමට කටයුතු කර නොතිබුණි.

3.4 <u>පවරා නොගත් වත්කම්</u>

සභාව සතු වැලබඩවත්ත කොටස, පෝරුවදණ්ඩ, පුවක්වත්ත නොහොත් බණ්ඩාරවත්ත හා කනත්තවත්ත කොටස යන ඉඩම් හා ඒවායේ ගොඩනැගිලිවල අයිතිය ප්‍රකාශ කිරීමට ඔප්පු හා ප්‍රකාශන ඔප්පු සභාව සතුව නොතිබුණි.

3.5 <u>මතබේදයට තුඩුදුන් ගනුදෙනු</u>

හොරණ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය මගින් පවත්වනු ලබන සායනය වෙනුවෙන් සහභාගි වන සභා නොවන සායන කම්කරුවන් 09 දෙනෙකු වෙනුවෙන් සභාව රු.677,299 ක් ගෙවා තිබුණි.

3.6 <u>ආර්ථික නොවූ ගනුදෙනු</u>

(අ) ජේසීබී යන්ත්‍රය පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ යාන්ත්‍රික ඉංජිනේරුගේ නිර්දේශ හා අනුමැතිය මත පමණක් අළුත්වැඩියා සිදුකලද 2016 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වරින් වර අළුත්වැඩියා කිරිම සඳහා රු.1,613,393 ක මුදලක් වැය කර තිබුණි. යන්ත්‍රයේ අඩුපාඩු එකවර පරික්ෂා කර අළුත්වැඩියා කටයුතු සිදු කලේ නම් මෙම වියදම අවම කර ගැනිමට හා වාහනය ඵලදායි ලෙස සේවයේ යොදවා ගැනිමේ හැකියාව තිබුණි.

(ආ) ගංවතුරින් පිඩාවට පත් ජනතාව වෙනුවෙන් සහන සැලසීම සඳහා බෝට්ටු ක්‍රියාකරුවෙකු වශයෙන් බඳවා ගන්නා ලද සේවකයෙකු වෙනුවෙන් එකී කාර්යය නිමවූ පසුවද වැටුප් වශයෙන් රු.228,000 ක මුදලක් ගෙවා තිබුණි.

(ඇ) ප්‍රමාණවත් ස්ථිර හා ආදේශක කම්කරුවන් සිටියදීත් දිනකට රු.1,000 ක දීමනාවක් ගෙවීමේ පදනම මත නුපුහුණු සේවකයින් සේවයේ යෙදවීම වෙනුවෙන් රු.3,888,500 ක් ගෙවා තිබුණි.

3.7 <u>ප්‍රසම්පාදනය</u>

වොට් 23 CFL බල්බ් මිලදී ගැනීම සඳහා මිල ගණන් එවන ලද සැපයුම්කරුවන් අතරින් තෝරාගත් සැපයුම්කරු විසින් ඉදිරිපත් කළ මිල වෙනස් කර තිබුණ ද එය මිල ගණන් විවෘත කරන ලද කමිටුවේ අවධානයට ලක් වි නොතිබුණ අතර 2017 වසර සඳහා තෝරාගැනීමේ ප්‍රමාදය හේතුවෙන් වොට් 23 CFL බල්බ මිලදී ගැනීමේදි රු.20,000 ක පාඩුවක් සිදු වි තිබුණි.

4. **<u>ගිණුම් කටයුතුභාවය හා යහපාලනය</u>**

4:1 **<u>අයවැය පාලනය</u>**

සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ගත හා තථ්‍ය ආදායම් සියයට 10 සිට සියයට 94 දක්වාත්, වියදම් සියයට 17 සිට සියයට 70 දක්වා වුත් පරාසයක විචලනයන් නිරීක්ෂණය වූ හෙයින් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

5. **<u>පද්ධති හා පාලන</u>**

විගණනයේදී නිරික්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| <u>පද්ධතිය</u> | <u>අඩුපාඩුව</u> |
|---|---|
| (අ) ගිණුම්කරණය | ගිණුම් වාර්තා නිවැරදිව ඉදිරිපත් නොකිරීම හේතුවෙන් වසර කිහිපයක සිට සංශෝධිත ගිණුම් ඉදිරිපත් කිරීමට සිදුවීම. |
| (ආ) වත්කම්/ දේපළ | i. හිමිකම් ඔප්පු ලබා නොගැනීම<br>Ii. ලේඛන වල දේපළ වටිනාකම් නොදැක්වීම. |
| (ඇ) ණයගැති/ණය හිමි | i. උපලේඛන පිළියෙල නොකිරීම<br>ii. කාල විශ්ලේෂණ පිළියෙල නොකිරීම |
| (ඈ) සේවක කළමනාකරණය | i. කාර්ය මණ්ඩලය අනුමත කර නොගැනීම.<br>ii. පුරප්පාඩු සම්පූර්ණ කර නොගැනීම. |
| (ඉ) අයවැය පාලනය | i. අයවැය හා තථ්‍ය වියදම් අතර විශාල විචලනයන් පැවතීම.<br>ii. ආදායම් ඇස්තමේන්තු තාත්වික නොවීම. |